සාරාංශය

International
Labour
Organization

100
1919-2019



# ශ්‍රී ලංකාවේ ශ්‍රම අනාගතය

## දිදුලන අනාගතයක් උදෙසා තාක්ෂණික සංක්‍රාමණය

# Future of Work in Sri Lanka

## Shaping technology transitions for a brighter future

# ශ්‍රී ලංකාවේ ශ්‍රම අනාගතය

## දිදුලන අනාගතයක් උදෙසා  තාක්ෂණික සංක්‍රාමණය

Copyright © International Labour Organization 2019
First published (2019)

Publications of the International Labour Office enjoy copyright under Protocol 2 of the Universal Copyright Convention. Nevertheless, short excerpts from them may be reproduced without authorization, on condition that the source is indicated. For rights of reproduction or translation, application should be made to ILO Publications (Rights and Licensing), International Labour Office, CH-1211 Geneva 22, Switzerland, or by email: rights@ilo.org. The International Labour Office welcomes such applications.

Libraries, institutions and other users registered with a reproduction rights organization may make copies in accordance with the licences issued to them for this purpose. Visit www.ifrro.org to find the reproduction rights organization in your country.

---

Future of Work in Sri Lanka: Shaping technology transitions for a brighter future

ISBN: 978-92-2-132995-4 (print) 978-92-2-132996-1 (web pdf)

International Labour Office: ILO Country Office for Sri Lanka and the Maldives

This publication was written by Vikrom Mathur, Urvashi Aneja, Ira Anjali Anwar, Aishwarya Shridhar and Natalia Sanchez of TANDEM Research, for ILO Country Office for Sri Lanka and the Maldives.

---

The designations employed in ILO publications, which are in conformity with United Nations practice, and the presentation of material therein do not imply the expression of any opinion whatsoever on the part of the International Labour Office concerning the legal status of any country, area or territory or of its authorities, or concerning the delimitation of its frontiers.

The responsibility for opinions expressed in signed articles, studies and other contributions rests solely with their authors, and publication does not constitute an endorsement by the International Labour Office of the opinions expressed in them.

Reference to names of firms and commercial products and processes does not imply their endorsement by the International Labour Office, and any failure to mention a particular firm, commercial product or process is not a sign of disapproval.

Information on ILO publications and digital products can be found at: www.ilo.org/publns.

---

Report Design: Harshyla Singh
Illustrations: Saket Ghaisas
Cover Art Design: Asitha Seneviratne

Printed in Sri Lanka

## පසුබිම

වර්තමානයේ රැකියා ලෝකය දැවැන්ත පරිවර්තණයකට ලක්වෙමින් පවතී. තාක්‍ෂණික වැඩිදියුණු වීම්, ජනසංයුතියේ වෙනස්කම්, වෙනස්වන දේශපාලන සංස්කෘති සහ සේවානියුක්ති සහ නිෂ්පාදන වෙනස්වීම් ආදී කරුණු රැසක බලපෑම හේතුවෙන් මිනිසා ජීවත්වන ස්වභාවය සහ ඔවුන්ගේ රැකියාවල ස්වභාවය පෙර අපේක්‍ෂා නොකළ පරිදි වෙනසකට ලක්වෙමින් පවතී. හතරවන කාර්මික විප්ලවයේ ප්‍රතිපල පිළිබඳ බොහෝ විද්වතුන්ගේ ආකර්ෂණය මෙන්ම මහජනතාවගේ ද අවධානය යොමුවී ඇත. කෘත්‍රිම බුද්ධිය **(Artificial Intelligence)**, බුද්ධිමය ස්වයංක්‍රියකරණය **(Intelligence Automation)** සහ රොබෝ තාක්‍ෂණය **(Robotics)** ආදී ඩිජිටල් තාක්‍ෂණික ක්‍රමවේද සිව්වන කාර්මික විප්ලවය යන්නෙන් සාමාන්‍යයෙන් අදහස් කෙරේ. හතරවන කාර්මික විප්ලවය යන සංකල්පය සර්වශුභවාදය සහ සර්ව අශුභවාදය අතර දෝලනය වන අතර, සංවර්ධනය වෙමින් පවතින රටවල විවිධ වූ සමාජ-ආර්ථික සංදර්භයන් තුළ මෙම සංකල්ප යළි විමසා බැලිය යුතුය.

සංවර්ධනය වෙමින් පවතින රටවල් බොහෝමයක තවමත් මූලික කාර්මික විප්ලවය ක්‍රමයෙන් පුළුල් වෙමින් පවතී. තවද තාක්‍ෂණික ගමන්මග රැකියා ලෝකය මත සිදුකරන බලපෑම, දේශපාලන සහ සමාජ අන්තර් ක්‍රියාකාරීත්වයට අනුකූලව හැඩගැසෙනු ඇත. සංවර්ධනය වෙමින් පවතින රටවල අනාගත රැකියා පරිසරය තුළ නැගීඑන තාක්‍ෂණික ක්‍රමවේද මගින් ඇතිකරන බලපෑම පිළිබඳ පිළිබඳ ප්‍රබල කතිකාවක් තවමත් ගොඩනැගී නොමැත. මෙම අධ්‍යයනය මගින් එම හිඩැස පිරවීමට අපේක්‍ෂා කෙරේ.

සිව්වන කාර්මික විප්ලවය සමග සම්බන්ධ වූ නැගීඑන තාක්‍ෂණික ක්‍රමවේද ශ්‍රී ලංකාවේ අනාගත රැකියා පරිසරයට කෙබඳු බලපෑමක් ඇති කරයිද? එම පරිසරය තුළ සාර්ථක වන්නන් සහ පරාජය වන්නන් කවුරුන්ද? ඉදිරියේදී ඇතිවන වෙනස්වීම් වලට සූදානම් වීම සඳහා රජයන්, කර්මාන්ත සහ පුරවැසියන් ලෙස කළ ගතහැකි ක්‍රියාමාර්ග මොනවාද? අප මෙම අධ්‍යනය තුලින් මූලික ගැටළු තුනක් පිළිබඳ අවධානය යොමු කිරීමට බලාපොරොත්තු වන්නෙමු. ස්වයංක්‍රියකරණය සහ රැකියා විස්ථාපනය; රැකියා තත්ත්වය සහ කම්කරු වෙළඳපල තුළ පවතින අසමානතා එම ගැටළු ත්‍රිත්ත්වයයි.

රැකියා ලෝකය තුළ සිදුවිය හැකි තාක්‍ෂණික බලපෑම පිළිබඳ සොයාගැනීම් 'යෝජනා ' ආකාරයෙන් මෙහි දක්වා ඇත. එම 'යෝජනා ' ඉදිරි වසර දහය-පහළොව තුළ ශ්‍රී ලංකාවේ අපේක්‍ෂිත වෙනස්කම් පුරෝකථනය කරන අතර දැනුම් විමර්ශනයෙන්, පාර්ශ්වකරුවන්ගෙන් සැදුම්ලත් ප්‍රතිපත්ති සම්පාදක කමිටුවක් සහ ගුණාත්මක සමීක්‍ෂණයක් ආශ්‍රයෙන් මෙම 'යෝජනා ' ගොඩනගා ඇත.

## ස්වයංක්‍රියකරණය සහ රැකියා විස්ථාපනය

බොහෝ විට නැගීඑන තාක්‍ෂණික ක්‍රමවේද සහ ස්වයංක්‍රියකරණය පිළිබඳ කතිකාව අනපේක්‍ෂිත රැකියා අහිමිවීම වටා පදනම්ව ඇත. කිසියම් ක්ෂේත්‍රයක් ස්වයංක්‍රියකරණය කිරීම සහ ඒ හරහා කම්කරුවාට ඇතිවිය හැකි බලපෑම් විවිධ සාධක මත පදනම්ව ඇත. තාක්‍ෂණ ශක්‍යතාව, පිරිවැය කාර්යක්‍ෂමතාව සහ භෞතික, තාක්‍ෂණික සහ සමාජ යටිතල පහසුකම් වල සුබලතාව එම සාධක අතර මූලික වේ. පහත දැක්වෙන 'යෝජනා' මගින් ඉහතදී සඳහන් කල සාධක ශ්‍රී ලංකාව තුළ කෙසේ ක්‍රියාත්මක වේ ද යන්න සහ එමගින් ඇතිවිය හැකි රැකියා විස්ථාපනය පිළිබඳ අවබෝධයක් ලබාගැනීමට අපේක්‍ෂා කරනු ලැබේ.

■ අනාගතයේදී තාක්‍ෂණික ක්‍රමවේද යොදාගැනීම හේතුවෙන් කෘෂිකර්මාන්තයට වඩාත් ඉහළ වාණිජ වටිනාකමක් හිමිවීම මෙන්ම ඊට සමගාමීව කම්කරුවන්ගේ අවශ්‍යතාවය අඩු වීමට ද එය මගපාදනු ඇත. කෘෂිකාර්මික ක්ෂේත්‍රය තුළ තාක්‍ෂණික ක්‍රමවේද භාවිත කිරීම සහ ඒකාබද්ධ කිරීම බොහෝ විට තීරණය වනුයේ ගෝලීය අගය දාමවල වාණිජ අපේක්‍ෂා මත පදනම්වය. මෙමගින් බොහෝ විට කෘෂිකර්මාන්තය

කම්කරුවන් මත යැපීම අවම කෙරෙනු ඇත. වර්තමානයේ පාරිසරික අභියෝග සහ සමාජ-ආර්ථික අවිනිශ්චිතතාව නිසා කම්කරුවන් ක්‍රම ක්‍රමයෙන් කෘෂිකර්මාන්තයෙන් ඉවත් වෙමින් සිටින බැවින් කෘෂිතාක්‍ෂණය හරහා පුළුල් රැකියා විස්ථාපනයක් සිදු නොවනු ඇත. නමුදු රැකියාවක් ලෙස කෘෂිකර්මාන්තයේ නියැලෙන ග්‍රාමීය කම්කරුවන් හට වෙනත් විකල්ප නොමැති වීමෙන් වැඩි බලපෑමක් ඇති විය හැකි අතර කන්න අනුව ඇතිවන කම්කරු අවශ්‍යතා වලට මෙමගින් බාධාවක් ඇතිවිය හැකිය.

- සීඝ්‍ර කම්කරු හිඟය සහ වෙනස්වන තරුණ අභිලාශ හේතුවෙන් වැවිලි අංශයට සිය නිෂ්පාදන ක්‍රියාවලියේ විවිධ අදියර ස්වයංක්‍රියකරණය කිරීමට සිදුවනු ඇත. ජීවනෝපාය පවත්වාගෙන යාමට ඇති අවස්ථා අඩුවීම සහ වෙනස්වන තරුණ අභිලාශ හේතුවෙන් අද වන විට වැවිලි කම්කරුවන්ගේ හිඟයක් පවතී. කම්කරු හිඟයට අමතරව ශ්‍රී ලාංකාව තුළ ස්වයංක්‍රියකරණයට අදාල තවත් අභියෝග රැසක් පවතී. කුඩා තේ වතුවල සුලභතාව, පාංශු ඛාදනය ඇතුළු භූගෝලීය සහ දේශගුණික ගැටළු ගණනාවක් සහ තේ දළු නෙළීමේ ක්‍රියාවලිය ස්වයංක්‍රියකරණය මගින් ලඟාකරගත නොහැකිවීම මෙම අභියෝග අතර වේ. මෙම වෙනස්කම් හරහා සීමිත රැකියා විස්ථාපනයක් ඇතිවිය හැකි අතර වැවිලි කර්මාන්තයේ සමස්ත සේවානියුක්තියට එමගින් බලපෑමක් ඇතිවිය හැකි යැයි අපේක්‍ෂා කළ නොහැකිය.

- බොහෝවිට ඉදිකිරීම් අංශයේ කම්කරු හිඟය තාක්‍ෂණික ක්‍රමවේද යොදාගැනීම වෙනුවට සංක්‍රමණික කම්කරුවන්ගෙන් සපුරාලනු ඇත. වර්තමානයේ උසස් ඉදිකිරීම් තාක්‍ෂණික ක්‍රමවේද සඳහා විශාල ආයෝජන අවශ්‍ය වේ. වර්තමානයේ ඉදිකිරීම් ක්ෂේත්‍රය ගෝලීය වශයෙන් සීඝ්‍ර වර්ධනයක් අත්පත් කරගෙන ඇතත්, ඉහළ පිරිවැය සහ තාක්‍ෂණික ක්‍රමවේද ක්‍රියාත්මක කිරීමේ ඇති සංකීර්ණ විෂමතාව නිසා තාක්‍ෂණය යොදාගැනීම මෙම ක්ෂේත්‍රය තුළ මන්දගාමී ස්වභාවයක් ගෙන ඇත. ශ්‍රී ලංකාවේ ඉදිකිරීම් කර්මාන්තයේ ඇති කම්කරු හිඟය සඳහා ඉදිකිරීම් තාක්‍ෂණික ක්‍රමවේද මගින් විසඳුම් ලබාදිය හැකි වුවත් ඉදිකිරීම් කර්මාන්තය තුළ තාක්‍ෂණික ක්‍රමවේද පිළිබඳ පවතින නොදැනුවත්කම නිසා නූතන ක්‍රමවේද භාවිතය මන්දගාමී වී ඇත. රට තුලට කම්කරු ආනයනය පිළිබඳ ඇති නීති රෙගුලාසි වල නියාමනය අඩු නිසා තාක්‍ෂණය වෙනුවට කුසලතා වලින් අඩු සංක්‍රමණික කම්කරුවන් වෙනුවෙන් ආයෝජනය කිරීම ඉදිකිරීම් සමාගම් වලට වඩාත් පහසු වී ඇත.

- කම්කරු ඉල්ලුම වර්ධනය වීමට භාණ්ඩ ප්‍රවාහනය සහ ගබඩා කිරීමේ පහසුකම් වල වර්ධනය වීම හේතුවන අතර, මෙහිදී ස්වයංක්‍රියකරණය ඉහළ මට්ටමින් භාවිත කිරීම රැකියා විස්ථාපනයට මඟපාදනු ඇත. භාණ්ඩ ප්‍රවාහනය සහ ගබඩා කිරීමේ ක්ෂේත්‍රය ශ්‍රී ලංකාවේ වාණිජ සහ වෙළඳ ක්ෂේත්‍ර වල වර්ධනයට දක්වන දායකත්වය පිළිබඳ සලකා බලමින් ජාතික අපනයන ක්‍රමෝපාය තුළ තීරණාත්මක අංශයක් ලෙස හඳුනාගෙන ඇත. භාණ්ඩ ප්‍රවාහනය සහ ගබඩා කිරීමේ සේවා සඳහා වැඩිවන ඉල්ලුම සහ ඊට සමගාමීව භාණ්ඩ ප්‍රවාහනය සහ ගබඩා කිරීමේ සේවා පුළුල් කිරීම හරහා ඉදිරි වසර පහක කාලය තුළ නව රැකියා අවස්ථා බිහිවීමේ ඉඩකඩක් පවතී. කෙසේවෙතත්, උසස් තාක්‍ෂණික ක්‍රමවේද සහ දක්‍ෂ කළමනාකරණ විසඳුම් භාවිතා කිරීම අධීක්‍ෂණ සහ කළමනාකරණ වැනි මැදි-කුසලතා රැකියා විස්ථාපනය රැකුල් විය හැකි අතර එමගින් ස්ථිර කම්කරුවන් සඳහා පවතින ඉල්ලුම ද අඩු කෙරෙනු ඇත.

- තොරතුරු තාක්ෂණ, ව්‍යාපාර කටයුතු පිටතට ලබාදීම **(BPO)** සහ මූල්‍ය අංශ වල, ආරම්භක සහ මැදි මට්ටමේ රැකියා සඳහා තාක්ෂණය මත පදනම් වූ රැකියා විස්ථාපනය බලපානු ඇත. නැගීඑන විශේෂඥ රැකියා වලට ප්‍රවේශ වීම සඳහා උසස් කුසලතා මෙන්ම යාවජීව ඉගෙනුම් ආයෝජන අත්‍යවශ්‍ය වනු ඇත. විශේෂයෙන් ජාත්‍යන්තර වෙළඳපල ඉලක්ක කර ගත් ශ්‍රී ලංකාවේ තොරතුරු තාක්ෂණ කර්මාන්තය තුළ දත්ත විශ්ලේෂණ සහ පරිගණක ආරක්ෂණ ක්ෂේත්‍ර වටා ගොඩනැගෙන තාක්ෂණික රැකියා සඳහා බොහෝවිට ඉල්ලුම වැඩිවනු ඇත. ඒ අතර ව්‍යාපාර කටයුතු පිටතට ලබාදීම සහ මූල්‍ය අංශයවල පසුපෙළ සහ මැදි මට්ටමේ පුනරාවර්තී රැකියා ස්වයංක්‍රියකරණය හේතුවෙන් විස්ථාපනය විය හැකිය. ශක්‍යතාව, අවශ්‍ය සංඛ්‍යාංක (**digital**) කුසලතා සමගින් පුහුණුව ලත් කම්කරුවන්ගේ සුලබතාව ගෝලීය ආර්ථිකය තුළ ශ්‍රී ලංකාවේ ඒකාබද්ධ වීමේ සීමාව ආදී

කරුණු දේශීය ආයතනවල තාක්ෂණය යොදාගැනීම මත බලපානු ඇත. මෙම සීඝ්‍ර තාක්ෂණික වෙනස්කම් නිසා රැකියා අහිමිවීමේ සහ අතිරික්තයක් ඇතිවීමේ විශාල ඉඩක් පවතින බැවින් තිරසර අන්දමින් ප්‍රතිකුසලතාකරණය සහ කුසලතා ඉහළ තලයකට ගෙන ඒම වැදගත් වේ.

■ නව වෙළඳපල අවස්ථා සඳහා විද්‍යුත් - වාණිජ්‍යය ( e - commerce ) ක්ෂේත්‍රයේ වර්ධනය මගපාදනු ඇත. නමුත් අඩු පුහුණුව ලත් තරුණ ප්‍රජාවගේ සමාජ චලනතාව සඳහා සම්ප්‍රදායික රැකියා අවස්ථා තවදුරටත් බිහි නොවනු ඇත. සිල්ලර වෙළඳාම් සඳහා යොමු වූ ශ්‍රී ලාංකේය තරුණ ප්‍රජාවගෙන් විශාල පිරිසකට රැකියා අහිමිවීමේ අවදානමක් හටගනු ඇත. කෘෂි සහ වැවිලි ක්ෂේත්‍රයෙන් බැහැරව විධිමත් රැකියාවකට පිවිසීමේ පහසුම මඟ ලෙස සිල්ලර රැකියා ක්ෂේත්‍රය තෝරාගන්නා තරුණ ප්‍රජාවට මෙය වඩාත් තදින් බලපානු ඇත. අනෙක් අතට, විද්‍යුත් - වාණිජ්‍යය ක්ෂේත්‍රයේ නැගී ඒමත් සමඟ මෙම තත්ත්වය තාක්ෂණික ශක්‍යතාව සහ අඩු ආයෝජන තුලින් සමපාත කර ගැනීමට අවස්ථාවන් උදාවනු ඇත. එමඟින් අඩු පුහුණුව ලත් කම්කරුවන් සඳහා විවිධ තනතුරුවල ඉල්ලුමක් හටගනු ඇත. කෙසේවෙතත් මෙම රැකියා ද ස්වයංක්‍රියකරණය වීමේ අවදානමක් පවතින බැවින් එම රැකියා ද තාවකාලික රැකියා වනු ඇත.

■ තාක්ෂණික ක්‍රමවේද යොදාගැනීම හරහා නිෂ්පාදන අංශයේ මැදි කුසලතා රැකියාවල අඩුවීමක් හටගනු ඇත. කාර්මික ස්වයංක්‍රියකරණය සහ කෘත්‍රිම බුද්ධිය වැනි නැගීඑන තාක්ෂණික ක්‍රමවේද භාවිත කිරීම ශ්‍රී ලාංකේය නිෂ්පාදන අංශය තුළ තවමත් පවතින්නේ ආරම්භක අවදියේය. නමුත් ස්වයංක්‍රියකරණය හරහා කම්කරු ඵලදායිතාව වැඩිදියුණු කිරීම මගින් දිගුකාලීන ලෙස කම්කරු ශ්‍රමය මත යැපීමට සිදුවීමේ අවදානම අඩු වේ. සංජානන උපයෝගීකරගත් සංකීර්ණ අධි කුසලතා රැකියා ස්වයංක්‍රියකරණයට ලක්වේ යයි අනුමාන කළ නොහැකි අතර, දැත්-දෑස් උපයෝගී කරගනිමින් කඩිනමින් පුහුණු කළ හැකි අතින් කරන රැකියා ස්වයංක්‍රියකරණය කිරීමේ ආර්ථික ප්‍රතිලාභයක් ද නොමැත. කෙසේවෙතත් පුහුණුව මගින් පමණක් ළඟාකරගත හැකි සහ විචාරශීලී චින්තනය අවශ්‍ය නොවන මැදි මට්ටමේ කුසලතා අවශ්‍ය දෛනික රැකියා ඉදිරි දශකයක කාලය තුළ ස්වයංක්‍රියකරණය වීමේ වැඩි අවදානමක් පවතී. ආහාර පිරිසැකසුම්කරණය ආදී තාක්ෂණය මුල්කර ගත් කර්මාන්ත ඉහළ මට්ටමේ ස්වයංක්‍රියකරණයකට ලක්විය හැකිය. කෙසේවෙතත්, සංවිධානාත්මක නිෂ්පාදන ක්ෂේත්‍රයේ මැදි මට්ටමේ කුසලතා රැකියා ඩිජිටල්කරණය සහ ස්වයංක්‍රියකරණය හේතුවෙන් විශාල වශයෙන් බලපෑමට ලක්වනු ඇත.

■ රාජ්‍ය අංශයේ රැකියා වලට තාක්ෂණික ක්‍රමවේද යොදාගැනීමේ ඉහළ හැකියාවක් පැවතිය ද බොහෝදුරට තාක්ෂණික පෙරළියෙන් ආරක්ෂා වනු ඇත. ශ්‍රී ලංකාවේ රාජ්‍ය අංශය පුළුල්ය. ඉලක්කගත ක්‍රියාමාර්ග නොගැනීම හේතුවෙන් රාජ්‍ය අංශය තාක්ෂණික පෙරළිය හරහා කැපීපෙනෙන ලෙස බලපෑමට ලක්වනු ඇතැයි සිතිය නොහැකිය. විද්‍යුත් පාලන ක්‍රමෝපායන් පිළිබඳ සංකල්පය (e - governance) පිළිබඳ සැලකීමේදී විධිමත් අධ්‍යාපන සහ පුහුණු ක්‍රියාමාර්ග මත එහි සාර්ථකත්වය තීරණය වනු ඇත. එමෙන්ම රජය තුළත් ඉන් පරිබාහිරවත් තාක්ෂණය සම්බන්ධව පවතින ජනප්‍රිය මතවල වෙනස්වීම් සහ නිලධාරීවාදය ද මෙහි සාර්ථකත්වය සඳහා බලපානු ඇත.

## රැකියා තත්ත්වය

නැගීඑන තාක්ෂණික ක්‍රමවේද ව්‍යාප්ත කිරීම මගින් ආයතනික සැකැස්ම සහ සේවක කළමනාකරණ ක්‍රමවේද වල වෙනස්කම් ඇති වෙමින් පවතී. පූර්ණකාලීන සහ ස්ථිර රැකියා වෙනුවට අර්ධකාලීන සහ ගිවිසුම්ගත රැකියා ආදේශනයත් සමඟ සේවකයන් හට හිමිවන ප්‍රතිලාභ සහ ආරක්ෂාව අවම වීමේ ඉඩකඩක් පවතී. ශ්‍රී ලංකාවේ විධිමත් රැකියාවලින් බැහැරවීම සේවකයා සහ සේවායෝජකයා යන දෙපාර්ශ්වයේ ම නම්‍යශීලි රැකියා සඳහා ඇති ඉල්ලුම සහ විශේෂයෙන් නිෂ්පාදන අංශය තුළ සේවා ගනුදෙනු සඳහා අන්තර්ජාලය තුලින් සිදුවන ගණුදෙනු තුලින් නිරූපණය වේ. මේ අනුව රැකියා පරිසරයේ ස්වභාවය සහ සංස්කෘතිය අඛණ්ඩව

වෙනස්වන බැවින් ඉහත සියලු කරුණු සම්මත සේවක ප්‍රමිතීන් අඩු කිරීම සඳහා බලපානු ඇත. සුදුසු රැකියා සහ රැකියා තත්ත්වයන් පිළිබඳ ප්‍රමුඛ දැක්මක් ඇතිකිරීම සඳහා වෙනස්වන තරුණ අභිලාශ ද හේතුවනු ඇත. පහත දැක්වෙන 'යෝජනා ' සතර මගින් නැගීඑන තාක්ෂණික ක්‍රමවේද හරහා සේවක තත්ත්වය වෙනස් වන ආකාරය පිළිබිඹු කෙරේ. රැකියාවේ ස්වභාවය, ඩිජිටල් මාධ්‍ය මත පදනම් වූ රැකියා, රැකියා සංස්කෘතිය සහ සේවක කළමනාකරණය සහ සාමූහික කේවල්කිරීමේ යාන්ත්‍රණය ආදී කරුණු විශේෂයෙන් මෙහිදී සලකා බැලේ.

■ සම්මත නොවන රැකියා අවස්ථා, විශේෂයෙන් අවම නිපුනතාවයක් අවශ්‍ය රැකියා වැඩිදියුණු වනු ඇත. පූර්ණකාලීන සහ ස්ථිර රැකියා වෙනුවට අර්ධකාලීන සහ කොන්ත්‍රාත් රැකියා හඳුන්වාදීමත්, අක්‍රමවත් රැකියාවල නියැලීමත් වැඩි වෙමින් පවතී. නව තාක්ෂණය හඳුන්වා දීමත් සමග, සේවායෝජකයන් හට තත්කාලීනව සිය කම්කරු අවශ්‍යතා හඳුනා ගැනීමටත් ඒවා කළමනාකරණය කර ගැනීමටත් හැකිවන අතර, එය රැකියා ස්ථානයෙන් පරිබාහිරව දුරස්ථව සිදුකර ගැනීමට ද හැකිවේ. මෙහි බලපෑම බොහෝවිට අවම නිපුනතාවයකින් රැකියාවල නිරතවන්නන් හට දැඩිව දැනෙනු ඇත. මන්ද, එම රැකියාවල වැඩි මානව මැදිහත්වීමකින් තොරව භෞතික සහ සංජානන කටයුතු ලෙස පුනර්වර්ති වේ.

■ අන්තර්ජාලය පාදක කොටගත් රැකියා වැඩිදියුණු වනු ඇති අතර, එමගින් අනවශ්‍ය ගතානුගතික කම්කරු ආරක්ෂණ යාන්ත්‍රණ විදහා පානු ඇත. විශේෂයෙන් සේවක-සේව්‍ය සබඳතා වලදී අන්තර්ජාලය පාදක කොටගත් රැකියා වලට විශාල බලපෑමක් සිදුකළ හැකිය. 'ගිග් ආර්ථිකය' මගින් අර්ධකාලීන සහ අනියම් සේවකයන් හට නව රැකියා අවස්ථා උත්පාදනය කෙරුන ද, ඒ හරහා නව අකාර්යක්ෂමතා සහ අසමානතා හටගැනීමේ ඉඩක් ද පවතී. අන්තර්ජාලය පාදක කොටගත් සිදුකරන රැකියා විසින් නව අවදානම් සහිත රැකියා ක්‍රම නිර්මාණය කරනු ඇති බවටත්, එමගින් සේවකයන්ගේ ජීවනෝපාය සහ හිමිකම් කැපීපෙනෙන අන්දමින් සෝදාපාළුවට ලක්වනු ඇති බවටත් මතයක් පවතී.

■ මානව සම්පත් කළමනාකරණය සඳහා තාක්‍ෂණය යොදාගැනීම මගින් රැකියා සංස්කෘතිය සීඝ්‍ර වෙනසකට ලක්වීමේ වැඩි ඉඩක් පවතී. සමාජ මාධ්‍ය, ස්මාර්ට් රැකියා අවකාශ, තාක්‍ෂණික ආවේෂණය ආදී තාක්‍ෂණික විසඳුම් ක්‍රියාවට නැංවීම මගින් විවිධ ආකාරයෙන් ශ්‍රම බලකායට සහ මානව සම්පත් කළමනාකරණයට එය බලපායි. උදාහරණයක් ලෙස, දුරස්ථ අධීක්‍ෂණ තාක්‍ෂණය හරහා සමාගම් වලට ඕනෑම ස්ථානයක සිට සිය සේවකයන් තත්කාලීනව අධීක්‍ෂණය කිරීමේ බලය හිමිවේ. එවැනි යෙදවුම් පිළිබඳ මත දෙකක් පවතී. Amazon වැනි සමාගම් තදබල අධීක්‍ෂණ ක්‍රමවේදයක් අනුගමනය කරන බවට චෝදනා එල්ලවී ඇති අතර, සමහර සමාගම්වල සේවය කරන කාන්තාවන්ට රැකියා ස්ථානයට නොයා දුරස්ථ ස්ථානයක සිට සේවය කිරීමේ අවස්ථාව මෙමගින් හිමිවේ.

■ අන්තර්ජාලය පදනම් කරගනිමින් සම්මත නොවන රැකියා බිහිවීම සහ ප්‍රගුණනය හරහා සාමූහික කේවල්කිරීම සහ සම්ප්‍රදායික වෘත්තීය සමිතිවල ස්වභාවය වෙනස් වීමේ ඉඩක් පවතී. නූතන රැකියා පරිසරය තුල වෘත්තීය සමිති වල ක්‍රියාකාරිත්වයට වූ සාමූහික කේවල්කිරීමේ ක්‍රමවේද වලට මෙය විශේෂයෙන් ම බලපායි. තවද, සාමූහික රැකියා අවකාශ සහ සේවකයන්ගේ අඩුව නිසා, පරිගණක පද්ධති හරහා සේවය කරන වෙනත් සේවකයන් සමග සම්බන්ධ වීමේ දුෂ්කරතා රැසකට මුහුණදීමට සිදුවනු ඇත. එනම්, ඩිජිටල් සහ සමාජ මාධ්‍ය දුරස්ථ සාමූහිකකරණය සඳහා නව ක්‍රමවේද ලෙස ප්‍රයෝජනවත් විය හැකිය.

## කම්කරු වෙළඳපල අසමානතා

වර්තමානයේ යටපත් වී ඇති සමාජ-ආර්ථික තත්ත්ව සහ තාක්ෂණික ප්‍රතිලාභ සඳහා ඇති ප්‍රවේශය සහ අසමානතා කම්කරු සුබසාධනය මගින් හැඩගැස්වෙනු ඇත. තාක්ෂණික පෙරළි සහ ඩිජිටල්කරණයට අදාළ අංශ සම මට්ටමකට ගෙනඒම සඳහා යොදාගත හැකි නමුත් නව තාක්ෂණික ක්‍රමවේද ව්‍යාප්තියත් සමග දැනට පවත්නා සමාජ අසමානතා තවත් නිර්මාණය වීමට හෝ පුළුල් වීමට ඉඩක් පවතී. පහත යෝජනා ත්‍රිත්ත්වය මගින් සමාජ-ආර්ථික සාධක, කලාපීය, දේශපාලනික සහ ආර්ථික වෙනස්කම් තාක්ෂණික ප්‍රතිලාභ බෙදාහැරීම තීරණය කරන ආකාරය පැහැදිලි කරයි.

■ කාන්තාවන් නව ආර්ථික අවස්ථා වැළඳ ගැනීමේ ඉඩක් පැවතිය ද කම්කරු ක්ෂේත්‍රයේ පවතින ස්ත්‍රී-පුරුෂ භේදය තවදුරටත් නොනැසී පවතිනු ඇත. අන්තර්ජාලය තුලින් සිදුකෙරුණු ලබන වෙළඳාම හරහා කාන්තාවන්ට ගමනාගමන සහ සංස්කෘතික බාධක මගහැරීමේ අවස්ථාව උදාවන අතර ඔවුන්ට සමාන වැටුප් හිමිකර ගැනීමේ අවස්ථාවද උදාවේ. එහෙත්, රැකියා ප්‍රවේශය සහ සම්බන්ධ කර ගැනීම සම්බන්ධ තවත් බාධක රැසක් නැගීඑන තාක්ෂණය සමග විසඳුමකින් තොරව එලෙසම පවතිනු ඇත. ඩිජිටල් ආර්ථිකය තුළ එලෙසින් ම සමාජ සහ කම්කරු රැකවරණයක් සේවකයන්ට ලබා දේ යැයි සිතිය නොහැකිය. මේ අතරින් බොහෝ දෙනෙක් දිගින් දිගට ම පවුලේ කටයුතු වල වගකීම ද දරන අතර, එම සේවයෙහි ඵලදායිතා අගයට නිසි පිළිගැනීමක් හිමිවන්නේ නැත.

■ තාක්ෂණය යොදාගැනීමත් සමග දැනට පවතින ප්‍රාදේශීය අසමානතා ප්‍රතිස්ථාපනය වීමට, බාධා වීමට හෝ වඩාත් ඉහළට මතුවීමට හෝ හැකිය. විශේෂයෙන් කොළඹ නගරය තුළ අධ්‍යාපනය, යටිතලපහසුකම් සහ ආර්ථික කටයුතු සඳහා විසමානුපාතිකව සිදු කරන ආයෝජන සහ උතුරු සහ නැගෙනහිර පළාත්වල සිවිල් ගැටුම් හේතුවෙන් ඇතිවී ඇති ප්‍රමාදය නිසා ශ්‍රී ලංකාවේ භාෂාමය නිපුණතාව, ඩිජිටල් කුසලතා සහ සුදුසු රැකියා සහ සේවානියුක්තිය සම්බන්ධව දැවැන්ත ප්‍රාදේශීය අසමානතාවක් ගොඩනගා ඇත. මෙම තත්ත්වයන් මගින් මෙරට පුරා තාක්ෂණික ප්‍රතිලාභ බෙදාහැරීම තීරණය වනු ඇත. ඩිජිටල් ආර්ථිකයට ඇති අසමාන ප්‍රවේශය නිසා දැනට පවත්නා ප්‍රාදේශීය අසමානතා යළි ප්‍රතිනිර්මාණය විය හැකිය.

■ කුසලතා පරතරය සහ භාෂා අවහිරතා සුහුරු රැකියා සහ තාක්ෂණික ප්‍රතිලාභ ලබාගැනීමේදී සේවකයන්ට මුහුණදීමට සිදුවන අභියෝග වේ. ශ්‍රී ලංකාව අනාගත රැකියා ලොවට සූදානම් වන විට අධ්‍යාපන සහ කුසලතා අංශවල පවතින පරතරය එරට ප්‍රධානත ම අභියෝගය වේ. ශ්‍රී ලංකාවේ තරුණ ප්‍රජාව අතරින් විශාල ප්‍රමාණයක් උසස් අධ්‍යාපනය හමාර කර නොමැති අතර ඔවුන් බොහෝ දෙනෙකුට මෘදු කුසලතා, ඩිජිටල් සාක්ෂරතාව සහ ඉංග්‍රීසි සාක්ෂරතාව ආදී කුසලතා පුහුණුවක් ද නොමැත. මෙය ඔවුන්ගේ අභිලාශ වලට ඔබින උසස් කුසලතා රැකියා ලබාගැනීමට ඔවුන්ට බාධා පමුණුවයි. එමෙන්ම, උගත් සහ අධ්‍යාපනය නොලත් යන තරුණ දෙකොට්ඨාසය ම සීඝ්‍රයෙන් වෙනස්වල රැකියා පරිසරයක් සහිත පුද්ගලික අංශය සඳහා සුදුසුකම් නොලැබුවත් අඩු කුසලතා සහ අතින් කරන රැකියා සඳහා ඔවුන් දෙපිරිස ම යොමුවීමට මැලිකමක් දක්වති.

## ඉදිරි ගමන

තාක්ෂණය විසින් සියලු දෙනා හට දිරිගාමී සහ සංවර්ධිත අනාගතයක් උදා නොකරන බැවින් එම තත්ත්වයට මුහුණදීම සඳහා තීරණාත්මක ප්‍රතිපත්ති සහ ක්‍රියාමාර්ග ගත යුතුය. එබැවින් අනාගත රැකියා ලොව සකස් කිරීම සඳහා මැදිහත්වීම අවශ්‍ය වන අතර එමගින් සැම ඇතුළත් වූ අනාගත රැකියා පරිසරයක් ගොඩනැගිය හැකිවනු ඇත. අපගේ අධ්‍යයනය දීප්තිමත් අංශ තුනක් සහ ප්‍රතිපත්ති සංකල්ප හතරක් හරහා මේ පිළිබඳ ඉදිරි ගමනක් යෝජනා කර සිටී. දීප්තිමත් අංශ යනු පහසුවෙන් ස්වයංක්‍රියකරණය කළ නොහැකි හෝ තාක්ෂණික නවෝත්පාදනය හරහා නව රැකියා අවස්ථා උත්පාදනය කළ හැකි අංශ වේ. ප්‍රතිපත්ති මාලාව ගරුත්වයෙන් යුතු රැකියා උත්පාදනය කළ හැකි ක්‍රමෝපායික සැලසුමක් නියෝජනය කරයි.

## දීප්තිමත් අංශ

- සෞඛ්‍ය සහ වැඩිහිටි සේවා ආර්ථිකය මගින් සුනිසි රැකියා අවස්ථා බිහිකර ගත හැකි අතර, ඒවා ස්වයංක්‍රියකරණය වීමේ අඩු අවදානමක් පවතී. විශේෂයෙන් වෛද්‍ය, මහලු සහ ළමා සුවතා අංශ ආදී ක්‍රියාකාරී කම්කරුවන් අවශ්‍ය කරන සේවා ආශ්‍රිත රැකියා මුළුමනින් ම ස්වයංක්‍රියකරණය වීමේ අවදානමක් නොමැත. සේවා සම්පාදකයා සහ සේවය ලබාගන්නා අතර පුද්ගලික සහ සංවේදී සබඳතාවක් ඇතිකර ගත යුතු ඕනෑම රැකියාවක් අනාගතයේදී විශාල වටිනාකමක් සහිත රැකියාවක් වනු ඇත. මෙය වයස්ගත ජනගහණය වැඩි ශ්‍රී ලංකාව වැනි රටකට විශේෂයෙන් වැදගත් වේ.

- තිරසර නිෂ්පාදන සහ සේවා සඳහා ඇති ඉල්ලුම මගින් නව රැකියා අවස්ථා බිහිවිය හැකිය. පාරිභෝගික දැනුවත්භාවය වඩාත් තිරසර නිෂ්පාදන සහ සේවා සඳහා දැඩි ඉල්ලුමක් ඇතිකර ඇත. කෘෂි, පුනර්ජනනීය බලශක්ති, අපද්‍රව්‍ය කළමනාකරණය සහ සංචාරක ආදී ක්ෂේත්‍ර තුළ තිරසාරත්වය මුල්කර ගත් අවස්ථා උදාකිරීමේ ප්‍රබල හැකියාවක් පවතී. තිරසර සේවානියුක්ති අවස්ථා දක්වා යන ගමනේදී කාන්තාවන්ට ද ශ්‍රම බලකායට ඇතුළත් වීමේ අවස්ථා විවර වේ.

- සංචාරක කර්මාන්තය තුළ රැකියා අවස්ථා වැඩිවනු ඇති අතර, එය තනි පුද්ගල සේවා සම්පාදකයන් සහ අන්තර්ජාලය මගින් ඉදිරියට ගෙනයනු ඇත. සංචාරක කර්මාන්තය මුල්කර ගත් මෘදුකාංග, නිවාස, ප්‍රවාහන, ආපනශාලා ආදී ඊට සම්බන්ධ ක්ෂේත්‍රවල සෘජු සහ වක්‍රාකාර රැකියා අවස්ථා බිහි කිරීමේ ප්‍රමුඛ කාර්යභාරයක් ඉටුකරනු ඇත. ශ්‍රී ලංකාව පුරා රැකියා අවස්ථා බිහි කිරීමේ තීරණාත්මක කාර්යභාරයක් ඉටුකරන අතර ම අන්තර්ජාලය තුළින්, හෝටල් කර්මාන්තයෙන් එපිට බිහිවී ඇති කුඩා පරිමාණ සහ අවිධිමත් ආයතන බලාත්මක කරමින් සංචාරක කර්මාන්තයට පිවිසීමට ඇති හැකියාව විමධ්‍යගත කිරීම සඳහා කටයුතු කරයි.

## සුනිසි රැකියා සඳහා ප්‍රතිපත්ති මාලාව : වැඩිදුර පර්යේෂණ සහ ගවේෂණ සඳහා ක්‍රමෝපාය

**1. අධ්‍යාපන සහ කුසලතා**

- ඩිජිටල් කුසලතා වැඩසටහන් ප්‍රවර්ධනය කිරීම සහ මූලික කුසලතා සවිබලගැන්වීම
- ප්‍රාදේශීයව පවතින පරතර වලට විසඳුම් ලබාදීම සඳහා අධ්‍යාපන සහ කුසලතා වැඩසටහන් දිරිමත් කිරීම
- දත්ත විද්‍යා සහ සයිබර් ආරක්ෂණ අංශවල රැකියා සඳහා කුසලතා ඇතිකිරීමේ ඉලක්කගත ක්‍රියාමාර්ග

**2. තාක්ෂණය සහ නවෝත්පාදන**

- දත්ත පාලන සැලසුමක් දියත් කිරීම
- අරමුණු කේන්ද්‍රීය නවෝත්පාදනයට සහයෝගය ලබාදීම
- තාක්ෂණය යොදාගැනීම සහ ඉදිරියට ගමන් කරන ව්‍යවසායකත්වය දිරිමත් කිරීම

**3. කම්කරු ආරක්ෂාව**

- කම්කරු ආරක්ෂණ සැලසුම් සංශෝධනය කිරීම
- පදනම් ආර්ථිකය නියාමනය කිරීම

**4. ප්‍රතිව්‍යාප්තිය**

- සමාජ ආරක්ෂණ ප්‍රතිපාදන සවිබල ගැන්වීම
- තාක්ෂණික ප්‍රතිලාභ ප්‍රතිව්‍යාප්තිය

## සිව් ප්‍රතිපත්ති මාර්ග

මීළඟ දශකය තුළ නියත වශයෙන්ම ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධන ගමන්මග තුළ විවිධ මට්ටම්වලින් තාක්ෂණීකරණය වීම දැකගත හැකිවනු ඇත. ගෝලීය වශයෙන් සිදුවෙමින් පවතින දැවැන්ත තාක්ෂණික වෙනස්කම් ශ්‍රී ලංකාවේ පවතින සුවිශේෂී සමාජ-ආර්ථික සංදර්භයට ඇතුළත් වීමේ වේගය සහ තීව්‍රතාව අනෙකුත් රටවලට වඩා වෙනස් ආකාරයෙන් සිදු වුව ද එම තාක්ෂණික ක්‍රියාමාර්ග වලට මෙරට ශ්‍රම බලකාය ඔරොත්තු නොදෙනු ඇත.

ඉහළ මට්ටමේ අපනයන කේන්ද්‍රීය නිෂ්පාදන සහ සේවා; විදේශ සෘජු ආයෝජන (FDI) නව්‍යකරණය, ව්‍යවසායකත්වය සහ ඩිජිටල් ආර්ථිකය ප්‍රවර්ධනය කිරීම මෑතකදී ජාතික හා ක්‍රමෝපායික මට්ටමින් ගනු ලැබූ ප්‍රතිපත්තිමය තීරණවල නිශ්චිත අරමුණු විය. ව්‍යවසාය වැඩිදියුණු කිරීම, තාක්ෂණය භාවිත කිරීම සහ නිෂ්පාදන හා ක්‍රියාවලි වැඩිදියුණු කිරීම සඳහා සහන ණය ලබාදීම සහ ගැලපෙන ප්‍රතිපාදන ලබාදීම ආදී ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග මේවන විට දියත්කර ඇත. මෙම සියලු දිශානතීන් ඉදිරි දශක දෙකක කාලය තුළ රටේ ආර්ථිකය හැඩගස්වනු ඇති අතර, එය වර්තමානයට වඩා තාක්ෂණික කේන්ද්‍රීය ආර්ථිකයක් ද වනු ඇත.

ඒ අනුව රට තුළ රැකියා ලෝකය ඵලදායී ලෙස හැඩගැස්වීම සඳහා ශ්‍රී ලංකාවට ප්‍රතිපත්ති සහ ක්‍රමෝපාය පෙළක අවශ්‍යතාව මතුවී ඇත. ඒ සඳහා විෂයපථ හතරක් ඔස්සේ ප්‍රතිපත්ති මාර්ග ගොඩනගා ඇත. පළමුව, නව ක්ෂේත්‍ර වල අවස්ථා හිමිකර ගැනීමත් ව්‍යවසායකත්ව කටයුතු ආරම්භ කිරීමත් සඳහා යාවජීව ඉගෙනුම් අවස්ථා සම්පාදනයට හා ශක්‍යතා වර්ධනය කිරීමට අධ්‍යාපන සහ කුසලතා ප්‍රතිපත්ති සමත්විය යුතුය. දෙවනුව, තාක්‍ෂණයත් සමග පසුගාමී වීමේ අවදානමක් ඇති පිරිසට සේවය කළ හැකි සහ නව අංශ ඔස්සේ රැකියා උත්පාදනය වේගවත් කළ හැකි යෙදවුම් ගොඩනගන තාක්‍ෂණික ගමන්මගක් හැඩගැස්වීම සඳහා තාක්‍ෂණික සහ නවෝත්පාදන ප්‍රතිපත්ති යොදාගත හැකිය.

තෙවනුව, රාජ්‍ය ප්‍රතිපත්ති සහ සවිමත් පොදු සුරක්ෂිතතා ජාල සහ නව සේවක දීමනා/ප්‍රතිලාභ ලබාදීම හරහා තාක්‍ෂණික ප්‍රතිලාභ වඩාත් පුළුල් ලෙස සමාජයට බෙදාහැරීම සඳහා ප්‍රතිව්‍යාප්ති ප්‍රතිපත්ති කටයුතු කළ යුතුය. අවසාන වශයෙන්, කොන්ත්‍රාත්ගත, ස්වයං රැකියාවල නිරත සේවකයන්ගේ සංඛ්‍යාව ඉහළ යාම සහ රැකියා කාණ්ඩකරණය හරහා සේවක සබඳතා පරිණාමය වීම නිසා එම කම්කරුවන් වඩාත් හොඳින් ආරක්ෂා කිරීම සඳහා කම්කරු ආරක්‍ෂණ ක්‍රමෝපාය තුළට නව ක්‍රමවේද ඇතුළත් විය යුතුය. පහත සඳහන් ගමන් මාර්ග අනාගත පර්යේෂණ සහ ගවේෂණ සඳහා දර්ශීය ලැයිස්තුවක් නියෝජනය කරන අතර, එම එක් එක් ගමන් මාර්ගයට ආවේණික වූ අභියෝග සහ ලාභාලාභ පෙළක් ද ඇති බව ද හඳුනා ගෙන ඇත.

### 1. අධ්‍යාපනය සහ කුසලතා ඇති කිරීම

ඩිජිටල් කුසලතා ප්‍රවර්ධනය කිරීම සහ මූලික කුසලතා සවිබල ගැන්වීම

ජාත්‍යන්තර කම්කරු සංවිධාන (ILO) නිවැරදිව සනිටුහන් කරන පරිදි, ''සීඝ්‍ර තාක්‍ෂණික වෙනස්කම් විසින් නිර්මාණය කරනු ලබන අධ්‍යාපන අවශ්‍යතා සහ කුසලතා අතර පවතින තීරණාත්මක පරතරය රැකියා සංක්‍රාන්ති සඳහා බලපා ඇති මූලික අභියෝගයකි". එමෙන්ම "ක්‍රමයෙන් විකාසනය වන රැකියා ලෝකයේ අවස්ථා උපරිම වශයෙන් ළඟා කර ගැනීම සඳහා සම්ප්‍රදායික අධ්‍යාපන සහ පුහුණු පද්ධති තුළ ප්‍රධාන වෙනස්කම් රැසක් සිදු විය යුතුය" හෙට දවසේ ඩිජිටල් ආර්ථිකයත් සමග එළඹෙන දශකය තුළ ශ්‍රම බලකායට එක්වීමට නියමිත ශ්‍රී ලාංකේය තරුණ ප්‍රජාවට තීරණාත්මක අවස්ථා රැසක් උදාකරන කවුළුවක් විවර වන බව සඳහන් කළ හැකිය. කම්කරුවන් රැකියා පරිසරයට අනුගත කිරීම සඳහා තාක්‍ෂණික කුසලතාවලට එහා ගිය

ඩිජිටල් කුසලතා මැදිහත්වීමක් අවශ්‍ය වුවත්, කුසලතා ගොඩනැගීම අධ්‍යාපනයට ආදේශකයක් ලෙස කටයුතු නොකළ යුතුය. ශ්‍රී ලංකාවේ වයස්ගත වෙමින් සිටින ශ්‍රම බලකායේ යාවජීව ඉගෙනුම් හැකියාව සහ අනුගත වීමේ ධාරිතාවට ඒකාබද්ධව ගැටළු නිරාකරණයට අදාළ මූලික දැනුම ලබාදීම අත්‍යවශ්‍ය වේ. මෘදු කුසලතා ද අතිශය වැදගත් වන්නේ, කියවීම, ලිවීම සහ අංක ගණිතය පිළිබඳ මූලික දැනීමක් නොමැතිව උසස් මට්ටමේ විද්‍යාව, තාක්‍ෂණය, ඉංජිනේරු සහ ගණිතය (STEM) මත පදනම් වූ අධ්‍යාපනයක්, කේතකරණය සහ ඩිජිටල් කුසලතා අවශ්‍ය වන අනාගතයක් උදාකර ගත නොහැකි බැවිනි.

ප්‍රාදේශීය වශයෙන් පවතින පරතරයට විසඳුම් ලබාදීම සඳහා අධ්‍යාපන සහ කුසලතා වැඩසටහන් ගොඩනැගීම අධ්‍යාපන සහ කුසලතා සමාර්ථ පිළිබඳ සැලකීමේදී බරපතළ ප්‍රාදේශීය අසමානතාවක් පවතී. මෙම විවිධත්වය ශ්‍රී ලංකාවේ ජාතිකත්වය සහ භාෂාව මත පදනම් වී ඇත. අධ්‍යාපනික සහ කුසලතා පරතර හඳුනා ගැනීමට සහ ඒවාට විසඳුම් ලබාදීමට නම් එම පරතර පවතින ප්‍රදේශ තුළ ඉලක්කගත ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග දියත් කළ යුතුය. මෙහිදී කාන්තාවන් සහ වෙනත් අඩු වරප්‍රසාදලාභී කණ්ඩායම් කෙරෙහි විශේෂ අවධානයක් යොමුකිරීම වැදගත් වේ.

ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාව සහ ඩිජිටල් සාක්‍ෂරතාව පිළිබඳ පවතින ප්‍රාදේශීය විෂමතාව කෙරෙහි සමාජමය අවධානය යොමු විය යුතුය. ඩිජිටල් පහසුකම් දේශීය භාෂාවලින් ලබාදීම සඳහා ක්‍රියාමාර්ග ගත යුතු වුවත්, ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාව සම්බන්ධව පවතින කැපීපෙනෙන ග්‍රාමීය-නාගරික පරතරය පිළිබඳ සැලකීමේදී ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාව වැඩිදියුණු කිරීම ද අවශ්‍ය වේ. එමෙන්ම, ග්‍රාමීය පළාත්වල ගුරුවරුන්ට ද ඉගෙනුම් මෙවලමක් ලෙස ඩිජිටල් තාක්‍ෂණය භාවිත කිරීම සඳහා අවශ්‍ය පුහුණුව ලබාදිය යුතුය. මෙය, සමස්ත අධ්‍යාපන ක්ෂේත්‍රයට ම ජාතික මට්ටමින් ඩිජිටල් සාක්‍ෂරතාව ඇතුළත් කරගැනීමේ ක්‍රියාවලියට අමතරව සිදුවිය යුත්තකි. මෙම ප්‍රයත්නය වේගවත් කිරීම සඳහා ජාත්‍යන්තර සංවිධාන සමග අත්වැල් බැඳ ගැනීම ප්‍රයෝජනවත් විය හැකිය. ශ්‍රී ලංකාවේ තාක්‍ෂණය යොදාගැනීම සම්බන්ධව කටයුතු කරන රාජ්‍ය නොවන සංවිධානයක් වන සර්වෝදය ෆියුෂන් සංවිධානය CISCO සහ Microsoft සමාගම් සමග එක්ව මෑතකදී දියත් කළ වැඩසටහන් මේ සඳහා කදිම උදාහරණ ලෙස හඳුන්වා දිය හැකිය. තවද, ආර්ථික නියෝජිත ආයතන සම්බන්ධව පවතින සමාජ-සංස්කෘතික සම්මතයන්ට මුහුණ දීම සඳහා පවුල් උපදේශනය ජාතික මට්ටමින් ප්‍රවර්ධනය කරමින් සම්ප්‍රදායික මධ්‍යස්ථාන වලට ඇතුළත් වීමට නොහැකි කාන්තාවන් සහ වෙනත් අඩු වරප්‍රසාදලාභී කණ්ඩායම් වලට ඉගෙනුම් අවකාශ නිර්මාණය කළ යුතුය.

## දත්ත විද්‍යා සහ සයිබර් ආරක්‍ෂණ ක්ෂේත්‍රවල රැකියා සඳහා අවශ්‍ය කුසලතා ගොඩනැගීම සඳහා ඉලක්කගත ක්‍රියාමාර්ග ගැනීම

ගෝලීය ආර්ථිකය තුළ පවතින තරගකාරීත්වය පවත්වා ගැනීම සඳහා වඩාත් උසස් තොරතුරු තාක්‍ෂණ රැකියා වලට වෘත්තීය සහ තාක්‍ෂණික උපාධිධාරීන් අනුගත විය යුතුය. තොරතුරු තාක්‍ෂණ ක්ෂේත්‍රයේ එදිනෙදා රැකියා වේගයෙන් ස්වයංක්‍රියකරණයට ලක්වෙමින් පවතින ශ්‍රී ලංකාවේ පරිණාමනය වෙමින් පවතින රැකියා පරිසරයට ගැළපෙන ලෙස අධ්‍යාපනය සහ කුසලතා ගොඩනැගිය යුතුය. ඉන්දියාවේ එවැනි ක්‍රියාමාර්ග ගෙන ඇත. තාක්‍ෂණික අධ්‍යාපනය සඳහා වන සමස්ත ඉන්දීය කවුන්සිලය (ICTE), කෘත්‍රිම බුද්ධිමය තාක්‍ෂණය, යාන්ත්‍රික ඉගෙනීම, රොබෝ තාක්‍ෂණය, දත්ත පිරිසැකසුම්කරණය සහ දත්ත විශ්ලේෂණය ආදී ක්ෂේත්‍ර ඇතුළත් කරමින් තාක්‍ෂණික පාඨමාලා නවීකරණය කිරීමට කටයුතු කරයි.

ශ්‍රී ලංකාව ඉදිරියට වීමට නියමිත විෂයමාලා නැවත සකස් කිරීම සහ යාවජීව ඉගෙනුම් හා රැකියා පුහුණුව සඳහා ඉලක්කගත ක්‍රියාමාර්ග වඩාත් හොඳින් යොදාගත හැක්කේ කෙසේදැයි හඳුනා ගැනීම සඳහා "ස්වයංක්‍රියකරණ සූදානම් දර්ශකයේ" ඉහළින් ම සිටින දකුණු කොරියාව, ජර්මනිය, සිංගප්පූරුව සහ ජපානය යන රාජ්‍යයන් ආදර්ශයට ගත යුතුය.

## 2 තාක්ෂණය සහ නවෝත්පාදනය

### දත්ත පාලන සැලසුමක් දියත් කිරීම

ඩිජිටල් යටිතල පහසුකම්වලට පහසුකම් සැලසීමට නම් දත්ත එක්රැස් කිරීම, ගබඩා කිරීම සහ දත්තවල හිමිකාරීත්වය ඵලදායී ලෙස පාලනය කිරීම වැදගත් වේ. ශ්‍රී ලංකාවේ පාර්ශ්වකරුවන් විසින් ඩිජිටල් පාරිභෝගිකයා සහ දත්ත ආරක්ෂණ නියාමන අතර පවතින කැපීපෙනෙන පරතරයන් හඳුනාගෙන ඇත. මේවන විට ශ්‍රී ලංකාව තුළ දත්ත පාලනය කිරීම සඳහා නීති නොමැති වුවත් 'දත්ත ආරක්ෂාව පිළිබඳ භාවිත සංග්‍රහයට' අනුව තොරතුරු සන්නිවේදන නියෝජිතායතනය දත්ත පාලනය කිරීමේ ප්‍රතිපත්තියක් සකස් කරමින් සිටින අතර එම ප්‍රතිපත්තිය 2003 තොරතුරු සන්නිවේදන තාක්ෂණ පනත යටතේ නියාමනයක් බවට පත්කිරීමටත් කටයුතු කරමින් සිටී.

මේ අනුව, ගෝලීය ප්‍රවණතා සහ විශිෂ්ට ක්‍රමවේද වලට අනුව කටයුතු කරන අතර ම ඩිජිටල් ආර්ථිකය බලාත්මක කෙරෙන දත්තවල පුද්ගලිකභාවය සහ බෙදාහැරීම සම්බන්ධව සමකාලීන නීති සකස් කිරීමට ශ්‍රී ලංකාව කටයුතු කළ යුතුය. යුරෝපා සංගමය තුළ ක්‍රියාත්මකවන GDRR ( පොදු දත්ත ආරක්ෂණ ක්‍රියාමාර්ග), එනම් රටවල් අතර වන්නා වූ (දේශසීමා හරහා) පුද්ගලික දත්ත ගලනය අධීක්ෂණය කරමින්, සුරක්ෂිත දත්ත ආරක්ෂණ වැඩපිළිවෙලක් නොමැති රාජ්‍යයන් සඳහා දත්ත ලබා ගැනීමේදී සීමා පැනවීම එක් විසඳුමකි.

### මෙහෙයුම් පාදක කොටගත් නවෝත්පාදනය සඳහා සහයෝගය ලබාදීම

ශ්‍රී ලංකාවේ ව්‍යවසාය මුහුණ දෙන අභියෝග වලට විසඳුම් ලබාදීම සඳහා මහජන ප්‍රතිපත්ති භාවිත කිරීමට මෙහෙයුම් පාදක කොටගත් නවෝත්පාදනයට හැකිය. ප්‍රදාන, නවෝත්පාදන වවුචර සහ පර්යේෂණ හා සංවර්ධන සහනාධාර හරහා, වෙළෙඳපොලට ගැලපෙන විසඳුම් සහ රැකියා ගොඩනගන තාක්ෂණික සමාගම් සවිබලගැන්වීමට සහ ඒවා ප්‍රවර්ධනය කිරීමට ශ්‍රී ලංකාවට හැකිය. උදාහරණයක් ලෙස, හරිත තාක්ෂණ කර්මාන්ත සඳහා සහයෝගය ලබාදීමට රජයට හැකිය. එමෙන්ම සූර්ය කෝෂ ස්ථාපිත කිරීම සඳහා සහනදායී ණය යෝජනා ක්‍රම, අභ්‍යන්තර ජල පිරිපහදු ක්‍රමවේද සඳහා සහනාධාර ලබාදීම ආදිය ද මේ යටතේ ගත හැකි ක්‍රියාමාර්ගවලට උදාහරණ කිහිපයකි. මෙමගින් හරිත කර්මාන්ත තුළ මුළුමනින් ම නව ආර්ථික ක්‍රියාකාරකම් ගොඩනැගීමට මග පැදෙන අතර ඒ හරහා නව රැකියා අවශ්‍යතා ද මතුවනු ඇත.

ඒ ආකාරයට, නිවාස සහ කර්මාන්ත වල වහල වල සූර්ය කෝෂ ස්ථාපිත කිරීම ප්‍රවර්ධනය කිරීම සඳහා රජය ගත් උත්සාහයේ ප්‍රතිඵලයක් ලෙස සූර්ය කෝෂ පැනල නිෂ්පාදනය සහ ස්ථාපිත කිරීම සඳහා නව කර්මාන්තයක් ගොඩනැගුනු අතර ඒ හරහා තරුණ ප්‍රජාවට නව තාක්ෂණික රැකියා අවස්ථා රැසක් ද උදාවිය. 'ශ්‍රී ලංකාවේ සූර්ය කෝෂ සමාගම්' පිළිබඳ අන්තර්ජාල සෙවීමෙන් කොළඹ නගර මධ්‍යයේ පමණක් එවැනි ව්‍යාපාර 20කට අධික ප්‍රමාණයක් ඇති බව හඳුනා ගත හැකිය. මෙවැනි ක්ෂේත්‍ර වල නියැලී සිටින ව්‍යවසායකයන් දිරිමත් කිරීම සඳහා රජයට දේශගුණික විපර්යාස, සෞඛ්‍ය, කෘෂිකර්මාන්ත, වයස්ගත ජනගහණය ආදී ක්ෂේත්‍ර ඔස්සේ 'දැවැන්ත අභියෝග' ප්‍රකාශයට පත්කළ හැකිය.

### තාක්ෂණය යොදාගැනීම සහ ව්‍යවසායකත්වය දිරිමත් කිරීම

තාක්ෂණය යොදාගැනීම සහ ස්වයංක්‍රියකරණය හරහා, අවතැන්වූ ශ්‍රම බලකාය සේවයෙහි යෙදවීමට සඳහා නව අවස්ථා උත්පාදනය කර ගත හැකිය. එමගින් කම්කරු හිඟය සහ එනිසා ඇතිවන්නාවූ තරගකාරිත්වය අහිමිවීම සහ තරුණයන්ට තවදුරටත් ආකර්ෂණය නොවන හා දැඩි ශ්‍රමයක් අවශ්‍ය ක්ෂේත්‍රවන කෘෂිකර්මාන්තය, වතු සේවය ආදීන්ට විසඳුම් ලබාගත හැක.

රජය විසින් පුද්ගලික අංශය තුළ නව තාක්ෂණය සහ එහි පුළුල් භාවිතය ප්‍රවර්ධනය කිරීමට කටයුතු කළ යුතුය. ව්‍යවසාය නවෝත්පාදනය සඳහා ඉලක්කගත ප්‍රතිපාදන ලබාදීම, තාක්ෂණික ආනයන සඳහා තීරුබදු අඩු කිරීම, ඩිජිටල් ගෙවීම් සඳහා පවතින සීමා ලිහිල් කිරීම සහ API ඒකාබද්ධ කිරීම සඳහා දිරිමත් කිරීම ආදී ක්‍රමවේද හරහා එය සිදු කළ හැකිය.

මේවන විට ජාතික මට්ටමින් කෘත්‍රිම බුද්ධිමය තාක්ෂණය යොදාගැනීම සම්බන්ධව පවතින්නේ සීමිත සාකච්ඡාවක් වුවත්, තොරතුරු තාක්ෂණ කර්මාන්තය මේ සම්බන්ධව යම් ක්‍රියාමාර්ග ගෙන ඇත. තොරතුරු තාක්ෂණ කර්මාන්තයට අදාළ ආයතනයක් වන SLASSCOM විසින් පසුගිය වසරේදී කෘත්‍රිම බුද්ධිය සම්බන්ධව මෙරට ප්‍රථම ජාතික සම්මන්ත්‍රණය පැවැත්වීමට කටයුතු කළේය. තවද, කොළඹ විශ්වවිද්‍යාලයේ පරිගණක විද්‍යා පීඨයේ දී දත්ත විද්‍යා පුහුණු වැඩසටහනක් ද ආරම්භ කර ඇත.

## 3 කම්කරු ආරක්ෂාව

### කම්කරු ආරක්ෂණ සැලසුම් සංශෝධනය කිරීම

තාක්ෂණික වැඩිදියුණු වීම් මගින් ප්‍රමිතියක් නොමැති රැකියා ආදී ව්‍යාපාරික ආකෘති බිහිවිය හැකි අතර ඒ සඳහා කම්කරු ආරක්ෂණය සහ රැකියා කොන්දේසි වල සංශෝධනයක් අවශ්‍යවනු ඇත. තවද, තොරතුරු බෙදාහදා ගැනීම, සහන ලබාගැනීම සහ සාමූහික කේවල් කිරීම සඳහා ඩිජිටල් තාක්ෂණය හරහා කම්කරුවන්ට අවස්ථාව සැලසිය හැකිය. ඒ හරහා ශ්‍රී ලංකාවේ අවිධිමත් සහ ප්‍රමිතියෙන් තොර රැකියා අංශය විධිමත් කිරීමේ අවස්ථාව අන්තර්ජාලය පාදක කොටගත ආර්ථිකයට හිමිවේ.

පොදු අරමුණු වෙනුවෙන් සංවිධානාත්මක වීම සහ සාමූහික කේවල් කිරීම ද සමාජ මාධ්‍ය හරහා බලාත්මක වී ඇති අතර මෙය විශේෂයෙන් ස්ථාන පදනම් කරගත් රැකියාවල නිරත රියදුරන්ට වැදගත් වේ. මේ සමගම සේවායෝජක සංවිධාන හා වෘත්තීය සංගම් සඳහා තාක්ෂණය සහ රැකියා ලොව අනාගතය යන අංශ වලට අදාළ ධාරිතා සංවර්ධනය ද අවශ්‍ය වනු ඇත.

කම්කරු සංවිධානවල ශක්තිය සහ සාමූහික කේවල් කිරීම තුළ පවතින ගෝලීය පසුබෑම, අසමානතාව ඉහළ යාමට බලපාන ප්‍රධානත ම සාධකයක් විය හැකිය. සාමූහික නියෝජනය සහ සමාජ සංවාදය ප්‍රවර්ධනය කිරීම හරහා මෙම ගැටළුවට පිළියම් ලබාදිය හැකි ලෙස මහජන ප්‍රතිපත්ති සකස් විය යුතුය. මෙමගින් විශාල ආර්ථික ව්‍යවසාය වලට රටේ ආර්ථික ප්‍රතිපත්ති තීරණය කිරීම සම්බන්ධව පවතින ප්‍රමුඛතාව පෙරළියකට ලක් කළ හැකිය. කම්කරු අවශ්‍යතා වලට අනුකූල වන ලෙස කම්කරු නීති සංශෝධනය කිරීමටත් යළි බලාත්මක කිරීමටත් කටයුතු කළ යුතුය.

### අන්තර්ජාලය හා අනෙකුත් ක්‍රමවේද මගින් මෙහෙයවනු ලබන ආර්ථික ක්‍රියාකාරකම් නියාමනය කිරීම

ශ්‍රී ලංකාවේ අන්තර්ජාලය හා අනෙකුත් ක්‍රමවේද මගින් මෙහෙයවනු ලබන ආර්ථික ක්‍රියාකාරකම් වර්ධනය වන විට රැකියා අවස්ථා ද වර්ධනය වනු ඇත. විශේෂයෙන් මෙය අවිධිමත් රැකියා අංශය තුළ සිදුවිය හැකි වෙනසක් වුවත් මෙය, නාගරික ප්‍රදේශවල උගත් තරුණ ප්‍රජාව සඳහා සමාජ ප්‍රගමනය සිදු කෙරෙන නව ක්‍රමවේදයක් ආකාරයෙන් සිදුවනු ඇත. ඒ හරහා, ලියාපදිංචිය සහ විධිමත් බැංකුකරණය තුළින් ශ්‍රී ලංකාවේ අන්තර්ජාලය හා අනෙකුත් ක්‍රමවේද මගින් මෙහෙයවනු ලබන ආර්ථික තුළ කම්කරුවන් හට යම් තරමක විධිමත් භාවයක් හිමිවනු ඇත.

කෙසේවෙතත්, මෙම පදනම් හරහා සම්ප්‍රදායික ස්වාමි-සේවක සබඳතා වෙනස් වීමට සහ කම්කරු අයිතීන් අහිමිවීමට හෝ පුළුවන. ඒ අනුව, නොවෙනස් පදනම් ආර්ථික නියාමනයක් සහ කම්කරු සුබසාධනය කේන්ද්‍ර කර ගත් නව, සාමූහික පදනම් ආකෘති හඳුනාගැනීම අත්‍යවශ්‍ය වනු ඇත.

එවැනි ක්‍රියාමාර්ග ඉන්දියාවේ රථ වාහන කෙටුම්පතෙහි දැකගත හැකිය. 1988 රථ වාහන පනතේ 93 වන වගන්තිය වෙනස් කිරීමට යෝජනා කරන එම කෙටුම්පත, OLA සහ Uber ආදී ධාවන වියදම් බෙදාගැනීමේ ක්‍රමවේද සඳහා බලපත්‍ර ලබාදීමට මෙන්ම ඒ සඳහා රජය විසින් අනුමත මිල ගණන් සහ මාර්ගෝපදේශ ලබාදීමට යෝජනා කර ඇත. කම්කරු සහ රාජ්‍ය හිමිකාරිත්වය සහිත පදනම් සඳහා Loconomic සහ Stocksy තවත් උදාහරණ වේ. එමගින් නිර්මාණය කෙරෙන අගය පොදු භාණ්ඩ ලෙස සැලකේ.

ධාවන වියදම් බෙදාගැනීමේ ක්‍රමවේද, ආහාර ගෙනයාමේ සේවා සහ අන්තර්ජාල වාණිජ සේවා ආදී දේශීය නීති වලට අනුකූල ස්ථාන පදනම් කර ගත් පදනම් සහ දුරස්ථ නොබැඳි රැකියා ආදී ජාත්‍යන්තර ක්‍රමවේද වලට අනුකූල අන්තර්ජාලය පදනම් කර ගත් ඩිජිටල් ශ්‍රමය පිළිබඳ ද වෙනම සලකා බැලීම වැදගත්ය. එවැනි අන්තර්ජාලය පදනම් කර ගත් ඩිජිටල් කම්කරුවන් පාලනය කිරීම සඳහා ශ්‍රී ලංකාවට ගෝලීය ක්‍රියාමාර්ග අනුගමනය කිරීමට සිදුවනු ඇත.

## 4 ප්‍රතිව්‍යාප්තිය

### සමාජ ආරක්ෂණ ප්‍රතිපාදන සවිබල ගැන්වීම

පදනම් ආර්ථිකය හරහා නව රැකියා සබඳතා ගොඩනගන අතර' සාමාන්‍ය රැකියා වෙනුවට නව ස්වයං-රැකියා සහ කොන්ත්‍රාත් රැකියා ඉදිරියට පැමිණෙමින් පවතී. එබැවින් මෙම වෙනස්වන රැකියා පරිසරය සඳහා සෞඛ්‍ය සේවා, විශ්‍රාම වැටුප්, සේවාවියුක්ති රක්ෂණය, මාතෘ නිවාඩු ආදී සමාජ ආරක්ෂණ ප්‍රතිපත්ති ලබාදිය යුතුය. විශේෂයෙන් රැකියා ලෝකය තාක්‍ෂණය මුල්කර ගනිමින් පරිවර්තණයකට ලක්වෙමින් සිටින බැවින් ලොව රටවල් ජාතික වශයෙන් අවම සමාජ ආරක්‍ෂණ සහතිකයක් ප්‍රකාශකයට පත් කළ යුතු බවට ජාත්‍යන්තර කම්කරු සංවිධානය (ILO) යෝජනා කර සිටී.

ශ්‍රී ලංකාව තුළ සැමට පොදු සේවාවියුක්ති රක්ෂණයක් නොමැත. සේවකයන් තාක්‍ෂණික විපර්යාසය හේතුවෙන් රැකියාවක් නොමැතිව සිටින විට හෝ නව රැකියාවක් සොයමින් සිටින විට ඔවුන්ට තාවකාලිකව සහයෝගය ලබාදීම සඳහා සේවාවියුක්ති අරමුදලක් සකස් කිරීම පිළිබඳ පාර්ශ්වකරුවන් සලකා බැලිය යුතුය. අර්ධ කාලීන, ස්ථිර සහ නියෝජිත ආයතන සේවකයන් සඳහා පරිපාලන ප්‍රතිපාදන ලබාදීම වෙනුවට පදනම් ආර්ථික සේවකයන් සඳහා විශේෂ ආරක්ෂාවක් ලබාදීම සඳහා යුරෝපා සංගමය ඉදිරිපත් කර ඇති ප්‍රතිපත්ති මාලාවේ ද මෙම කරුණ දැකගත හැකිය.

අවිධිමත් අංශයට සහ යැපුම් ගොවිතැනේ නියැලෙන පිරිසට මුදල් හුවමාරු සහ රැකියා තහවුරු කිරීමේ වැඩසටහන් ලබාදීම හරහා ඔවුන්ට මූලික ආදායම් සුරක්ෂිතතාවක් තහවුරු කිරීමට සමාජ ආරක්ෂණ සැලසුම් වලට හැකිවේ. මේ සඳහා ශ්‍රී ලංකාවට ඉන්දියාවේ මහත්මා ගාන්ධි ජාතික ග්‍රාමීය රැකියා සහතිකකරණ වැඩසටහන සහ දකුණු අප්‍රිකාවේ ක්‍රියාත්මක වෙනත් වැඩසටහන් ආදර්ශයට ගත හැකිය.

### තාක්‍ෂණික ප්‍රතිලාභ ප්‍රතිව්‍යාප්තිය

තාක්‍ෂණය මුල්කර ගත් ආර්ථික වර්ධනය සිල්ලර, ගිණුම්කරණ ආදී මැදි මට්ටමේ රැකියාවලට බලපෑමක් කරමින් කම්කරුවාට වඩා ප්‍රාග්ධනයට ප්‍රතිලාභ සලසයි. මෙය සම්ප්‍රදායික සහ නව්‍ය ප්‍රතිව්‍යාප්ති ක්‍රමවේද හරහා විසඳීමට කටයුතු කළ යුතුය. තාක්‍ෂණික ප්‍රතිලාභ ප්‍රතිව්‍යාප්ත කිරීම පිළිබඳ ගෝලීය සාකච්ඡා රැසක්

සිදුවන අතර ශ්‍රී ලංකාවට ඒවායින් දැනුම ලබාගත හැකිය.
රොබෝ යන්ත්‍ර 'ඉලෙක්ට්‍රොනික මිනිසුන්' ලෙස හඳුනා ගනිමින් ඒවාට ද 'රොබෝ බද්දක්' අය කළ යුතු බවට බිල් ගේට්ස් වැනි තාක්ෂණික ක්ෂේත්‍රයේ දැවැන්තයන් යෝජනා කළ ද එමගින් ද සිදු වන්නේ කම්කරුවෙකුගෙන් බද්දක් අයකර ගැනීමක් වන බැවින් යුරෝපා සංගමය එම ප්‍රතිපත්තිය නිෂ්ප්‍රභා කළේය. යුරෝපා සංගමයේ පාර්ලිමේන්තුවේදී විවාදයට ලක්වූ කරුණක් නම්, බදු අරමුණු වෙනුවෙන්, රොබෝ යන්ත්‍ර භාවිත කිරීම හරහා තමන් සමාජ ආරක්ෂණය වෙනුවෙන් ඉතිරිකර ඇති ඉතුරුම් ප්‍රමාණය හෙළි කළ යුතු බවය.

ඉන්දියාවේ NITI Aayog ආයතනයේ උප සභාපතිවරයා යෝජනා කර සිටින්නේ, කම්කරු සහනාධාර ලබාදීම තුළින් 'කම්කරුවන්ගෙන් උපරිම ඵල නෙලා ගැනීමේ අරමුදලකට' කුසලතා ගොඩනැගීමට සහ කම්කරුවන් බඳවා ගැනීමේ ක්‍රමවේද සඳහා දිරිමත් කිරීමට හැකිවන බවය. අනෙක් අතට, ආයතන රාජ්‍ය රැකියා වියුක්තිය සහ සමාජ ආරක්ෂණ අරමුදල් සඳහා දායකත්වය ලබාදෙන ක්‍රියාපටිපාටියක් හඳුන්වා දීමට ප්‍රංශය කටයුතු කර ඇත. ඒ අනුව එම ආයතන කම්කරුවන් ඉවත් කිරීමේදී නෛතිකව ඊට වගකීමට බැඳී සිටී.

මුදලින් උපකාර කරමින් සේවයට බඳවා ගැනීමේ සහ ඔවුන්ට ණය ලබාදීමේ ක්‍රමවේදය, රැකියා විරහිත කම්කරුවන් බඳවා ගැනීමටත් රැකියා නිර්මාණය කිරීමටත් සේවායෝජකයන් තවදුරටත් දිරිමත් කිරීම සඳහා යොදාගත හැකිය. එමෙන්ම, සේවානියුක්ති සම්භාර විකල්ප සැලසුමේ සැම ඇතුළත් වූ සංස්කරණ, 'සේවානියුක්ති හිමිකාරිත්ව භාරකාර මණ්ඩල' ආදී නව හිමිකාරිත්ව තත්ත්ව හරහා නියෝජිත ආයතන මට්ටමින් ප්‍රතිව්‍යාප්ති ක්‍රියාපටිපාටි ගොඩනැගීමේ හැකියාවෙන් යුතුවෙයි.

තාක්ෂණය පිළිබඳ සැලකීමේදී සහ රැකියා සුරක්ෂිතතාව ඉතා අපහසු තත්ත්වයකට පත්වන විට සේවකයන් හට සහනයක් වීමේ ක්‍රමයක් ලෙස "විශ්වීය මූලික ආදායම් සංකල්පය" ද මේවන විට සාකච්ඡාවට ලක්වෙමින් පවතී.

වෙළඳපල බලපෑම් වලට පමණක් අනුගතව තාක්ෂණික ක්‍රමවේදවලට සැමට සුනිසි රැකියා ලබාදීමට හැකිවනු ඇතැයි අපේක්ෂා කළ නොහැකිය. එමෙන්ම දැනට ශ්‍රම වෙළඳපල තුළ පවතින අසමානතා පිළිබඳ ඔවුන් හඬ නැගීමේ අවදානමක් ද පවතී. මෙහි දක්වා ඇති ප්‍රතිපත්ති ගමන්මග වැඩිදුර විමර්ශනය සහ සාකච්ඡාව සඳහා ආරම්භක ප්‍රවේශයක් පමණක් වන අතර සාධාරණ සහ සියලු දෙනා ඇතුළත් වන පරිදි ප්‍රතිඵල ලබා ගැනීම සඳහා තාක්ෂණික ක්‍රමෝපාය ක්‍රියාත්මක කිරීමට සිදුවනු ඇත.

Knowledge Partner

TANDEM RESEARCH

SOCIAL JUSTICE
DECENT WORK

ILO Country Office for Sri Lanka and the Maldives
202 - 204, Bauddhaloka Mawatha
Colombo 7,Sri Lanka
Tel : +94 11 259 2525 Fax : +94 11 250 0865
www.ilo.org/colombo